# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු (පහළ ශ්‍රේණිය)

සුදුසුකම් : (i) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අ.පො.ස (සා.පෙ) විභාගය සමත් වී තිබීම. සමත් වූ විෂයයන් අතර සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් ඇතුළත් විය යුතු අතර මධ්‍යම ප්‍රමාණයේ ලිතෝ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳව වසර 05ක පළපුරුද්දක් තිබිය යුතුය.

හෝ

(ii) කනිෂ්ඨ පාසැල් සහතිකය හෝ 08 වන ශ්‍රේණිය සමත් වී තිබීම සහ මධ්‍යම ප්‍රමාණයේ ලිතෝ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳව වසර 07ක පළපුරුද්දක් තිබිය යුතුය.

සටහන : පළපුරුදු කාලසීමාව ගණනය කිරීමේදී ආධුනික කාලය ද සලකා බලනු ලැබේ.

වැටුප් පරිමාණය : රු. 42,590 - 18 X 615 – 53,660 [U-MN 3 (II)]
මෙම වැටුප් පරිමාණය හිමි වන්නේ 2020.01.01 දින සිට වන අතර බඳවා ගැනීමේදී රු. 38,520/- වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

**සටහන : 2019.07.28 දින සිළුමිණ පුවත්පතෙහි පළකරන ලද දැන්වීමට අනුව මෙම තනතුර සඳහා අයදුම් කළ අය නැවත අයදුම් කළ යුතු වේ.**

### ලිතෝ චිත්‍ර ශිල්පී

සුදුසුකම් : (i) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත්වීම සහ ලිතෝ ආර්ට්ස්, පේස්ට් අප් සහ ලේ අවුට් වැඩ පිළිබඳව අවුරුදු පහක පළපුරුද්දක් තිබීම.

හෝ

(ii) කනිෂ්ඨ පාසැල් සහතිකය හෝ අටවැනි ශ්‍රේණිය සමත් වීම සහ ලිතෝ ආර්ට්ස්, පේස්ට් අප් සහ ලේ අවුට් වැඩ පිළිබඳව අවුරුදු හතක පළපුරුද්දක් තිබීම.

සටහන : පළපුරුද්ද සඳහා පුහුණුවීමේ කාලය ද ගණන් ගනු ලැබේ.

වැටුප් පරිමාණය : රු. 42,885 - 18 X 660 – 54,765 [U-MN 3 (II)]

මෙම තනතුරු සඳහා මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ගෙවනු ලැබේ.

- ජීවන වියදම් දීමනාව (රු. 7,800/=)
- අතිරේක මාසික දීමනාව (20%)
- මාසික අන්තර් දීමනාව (45%)

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

තමාගේ නම සහ ලිපිනය ලියන ලද සෙ.මී. 23 x 10 ප්‍රමාණයේ මුද්දර සවරයක් 2020.04.30 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය නාවල, නුගේගොඩ ලිපිනයට එවීමෙන් හෝ ආයතන අංශය වෙත පැමිණ අයදුම්පත් ලබා ගත හැකිය. විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරන ලද අයදුම්පත් හැර වෙනත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය නාවල, නුගේගොඩ යන ලිපිනයට 2020.05.07 **දින හෝ එදිනට පෙර ලැබෙන සේ** එවිය යුතුය. නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය. අයදුම්පත් සමඟ සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, සහතිකවල පිටපත් අමුණා නොතිබීම, අපැහැදිලි බව හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

අයදුම්පත් සහ විස්තර https://www.ou.ac.lk/vacancies/ වෙතින් ද ලබාගත හැක.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ

2021.04.18

University Web Site : www.ou.ac.lk

Source: Sunday Observer (2021.04.18)